II බෞද්ධ උරුමය හා සමකාලීන අවශ්‍යතා
II තම්බිමුත්තු තුරෙයිසිංහම්
II කේන්ද්‍රය, ආයුර්වේදය හා අංගම් සටන්ක්‍රම
III ඇමරිකාව හා ඉරානය න්‍යෂ්ටික ගැටුමක

දිවයින අතිරේකය

III "අධ්‍යාපන තොරතුරු" නැතිව පාසලින් සාමකාමී දරුවෝ බිහිකළ නොහැක
IV බස් වහරින් දිය දෝතක්
IV කෘතිය හා කතෘ නම් කරන්න
IV "මා පයට තණ තිල්ල" ලියූ ජේ. විජේතුංග
IV පොත් පත්

බෞද්ධ ප්‍රබෝධයට මෙත්තානන්ද දයකත්වය

කීර්තිමත් සිංහල බෞද්ධ නායකයකු වූ එල්. එම්. මෙත්තානන්ද ශූරීන්ගේ ජන්ම ශත සංවත්සරය ඉකුත් වසරට යෙදී තිබිණි. ඒ නිමිත්තෙන් පැවැති සමරු දෙසුමෙන් සැකසුණු ලිපියකි මේ.

(මුල් කොටස ඉකුත් සතියේ පළවීය.)

ආනන්දයේ විදුහල්පතිවරයාව සිටි වර්ෂ 10 කාලය තුළ මෙත්තානන්ද මහතා තෑගි ප්‍රදානෝත්සව දිනවල පැවැත්වූ කථා රටේ සිටි ප්‍රභූන් බුද්ධිමතුන්, අධ්‍යාපන විශේෂඥයින් සහ මහජනතාව ඉතා ඕනෑකමින් අසා සිටියහ. කියවූහ. ඔහුගේ අදහස්වල සහ ක්‍රියා මාර්ග පිළිබඳ සහේතුකව දැක්වූ විශ්ලේෂණයන්ට අභියෝග කිරීමට එකල කිසිවකු සමත් නොවීය.

ආනන්දයේ විදුහල්පති ලෙස බෞද්ධ අධ්‍යාපනයට හා බුද්ධාගමට ඉමහත් සේවයක් කරමින් සිටියදීම, මෙත්තානන්ද මහතා දෙස, බස, රැස යන ත්‍රිත්වය මෙරටේ ආරක්ෂාකර ගත යුතුයයන උදාර චේතනාවෙන් කටයුතු කිරීමට පෙළඹුණි. එතුමා 1945 ආනන්දයේ විදුහල්පති වන අවධියේ ඇතිවූ වාතාවරණයද මීට බලපෑවාට කිසිදු සැකයක් නැත. දෙස, බස, රැස තම ජීවිතයටත් වඩා උදාර ලෙස සලකා ඒ වෙනුවෙන් සටන් කිරීමට සිටි මුනිදාස කුමාරතුංගයෝ 1944 මාර්තු මස 02 වැනි දින ලංකා මාතාව සඳහටම හැර ගියහ. 1944 මැයි මස 31 වැනි දින ආනන්දයට සහ බෞද්ධ අධ්‍යාපනයට විශිෂ්ට හා අමරණීය සේවයක් කළ ශ්‍රීමත් ඩී. බී. ජයතිලක මැතිතුමාද නැතිවිය. ඒ අතර මෙරටේ නිදහස් අධ්‍යාපන පනත 1945 ඔක්තෝබර් මස 10 වැනි දින සම්මතව තිබුණි. සෝල්බරි කොමිෂම මෙරටේ ආණ්ඩුක්‍රම විෂයෙහි ප්‍රතිසංස්කරණ සඳහා කටයුතු කරමින් සිටි අවධියක් විය. මෙසේ ලංකාවේ අධ්‍යාපන, ආගමික, සාමාජික සහ දේශපාලන විෂයෙහි නව වෙනස්කම් ඇතිවීගෙන ආ කාල පරිච්ඡේදයක් ඇතිවීම මෙත්තානන්ද මහතාගේ නෙත් මේ කෙරෙහි යොමුවීම නිතැතින් සිදුවිය. තමා දැරූ විදුහල්පති තනතුරේ භාරදූර කටයුතු ඉටුකරන අතරම, රටේ ජාතික ප්‍රගතිය කෙරෙහි තම අදහස් ප්‍රකාශ කිරීමේ වැදගත්කම වටහා ගත්තේය. එතුමා 1948 - 1952 යන කාලය තුල ආනන්ද විද්‍යාලයේ ත්‍යාග ප්‍රදානෝත්සව වලදී ඉදිරිපත් කළ වාර්තාවල තමා ආනන්ද විදුහලේ ක්‍රියාගත කළ ජාතික වැඩ පිළිවෙලත්, එමගින් ජාතිමාමක සිසු කැළක් බිහි කිරීමට දමන ලද අඩිතාලමත්, රටේ අධ්‍යාපන ආගමික හා සාමාජීය ප්‍රගතිය කෙරෙහි දැක්වූ ආකල්පත් මැනවින් පිළිඹිබු වේ. මෙම වාර්තා එතුමාගේ නිර්ව්‍යාජත්වයත්, ප්‍රතිපත්ති ගරුකත්වයත්, උසස් අදහස්වලත්, ප්‍රතිමූර්තියක් ලෙස සැලකිය හැකිය. ලංකා මාතාව 1948 නිදහස ලබන අවධියේ ආනන්දයේ විදුහල්පති ලෙස කටයුතු කිරීමෙන් ලද ආභාසය නිදහස් ලංකාවක් ඉදිරියට ගොඩනැගීමේ කර්තව්‍යයේදී කෙසේ කටයුතු සැලසිය යුතුද යන්න ගැන පැහැදිලි අවබෝධයක් රටේ පාලකයින්ට සහ ජනතාවට ලබා දීමට උපකාරී වී යයි කිව හැකිය. 1950 බිහිවූ ජාතික කොඩියත්, 1951 දී නිර්මිත ජාතික ගීයත්, ජාතියක් ගොඩනැගීමෙහිලා ඉතා වැදගත් වුවත්, ඊටත් වඩා කටයුතු රාශියක් ඉදිරියට ඉටුකළ යුතු බව නිදහස් ජාතිකයට මතක්කර දීම එතුමාගේ උදාර අදහස විය.

වර්ෂ 1948 තම විද්‍යාලයීය ත්‍යාග ප්‍රදානෝත්සවයේදී වාර්තාව ඉදිරිපත් කරමින් තමන් අනාගතයේදී උරදීමට යන ජාතික මෙහෙවර ගැන ඉඟියක් මෙත්තානන්දයන් විසින් ලබාදුන් බව පෙනේ. ආනන්ද විදුහලේ ආදී කර්තෘවරුන්ගේ පරම අදහස් විජාතිකරණය සහ බටහිර සංස්කෘතියට නැඹියාව වැළැක්වීම බව පෙන්වී. ජාතියේ නිදහස ලබාගත් මේ මොහොතේ ජාතියේ උද්දීපනයට මෙම විදුහල ඉතා කැපවී කටයුතු කළයුතු බව දැක්වී. සමාජයේ ඇති හොඳ සහ නරක යන දෙපැත්තම සලකා බැලීමට කාලය පැමිණ ඇති බව වාර්තාවේ කියැවිණි. මෙම සමාජයේ ඇති බරපතල වැරදි වලින් අන්තගාමී ආත්මාර්ථකාමිත්වය, පගාව, දූෂණය සහ පිටුපස දොරින් බලපෑම් ඇති කිරීම වැඩිවී ඇති බවත් තම විදුහල මෙම ප්‍රශ්නවලට පිළියම් සෙවිය යුතු බවත් කිවී. කපටිකම, වංචාව සහ ද්විත්ව පෞරුෂයට අධ්‍යාපනයේ තැනක් නැත. ආනන්ද විදුහලේ ඇති කළ ක්‍රියා පිළිවෙත අනුව, පිටුපස්සා දොරින් බලපෑම් කරන අයට තැනක් නැත. අප විදුහලේ සිසුනට උගන්වනු ලබන්නේ හුදෙක් කුසලතාවය සහ ඔප්පුකරනු ලැබූ දක්ෂතාවය මිස අන් කිසිදු දෙයක් පිළිනොගන්නා බවය. අප රට නිදහස්වී ඇති මෙබඳු සමයක සිසුන්ද ඔවුන් පුරවැසියන් ලෙස කටයුතු කිරීමේදී දක්ෂතාවය හා කුසලතාවය සඳහා සූදානම් වීමත් පුරුදු පුහුණු කරනු ලබයි. යන්නය. සෑම දෙනාටම ශාස්ත්‍රීය අධ්‍යාපනයක් ලැබීමට විශ්ව විද්‍යාලවලට යා නොහැකි බවත්, කුසලතාවය අඩු සිසුනට ප්‍රායෝගික පුහුණුව මගින් රැකියා සඳහා උචිත අධ්‍යාපනයක් සැලසීම මැනවයි අවධාරණය කළේය. ආනන්ද විදුහලට සිසුන් ඇතුළුකර ගැනීමට ඇති තදබදය මෙත්තානන්ද මැතිතුමා දුටුවේ 1948 දී තරම් ඈත කාලයකදීය. එබැවින් ආනන්ද විදුහලට ඇතුලත් කර ගැනීමට නොහැකි සිසුන් සඳහා මෙවැනිම පාසලක් ඇරඹිය යුතු බව හෙතෙම පරම විඥානාර්ථ බෞද්ධ සමාගමට පෙන්වා දුන්නේය.

1952 මාර්තු මස 08 වැනි දින පැවති ආනන්ද විද්‍යාලයේ තෑගි බෙද දීමේදී මෙත්තානන්දයන් කළ කථාව මෙරට අධ්‍යාපන ක්ෂේත්‍රයේ අනාවැකි පහළ කිරීමක් ලෙස සැලකිය හැකිය. 1951 අධ්‍යාපන සංශෝධන පනත ගැන තම අදහස් දැක්වූ මෙත්තානන්ද මහතා තුන්වැනි පංතියේ සිට ඉංග්‍රීසි භාෂාව අනිවාර්ය කිරීම ගැන විරුදු විය. මෙම ප්‍රතිපත්තියෙන් රටේ ලාංකික ජනතාව අතර ඉංග්‍රීසි භාවිතය 6% සිට 100% ක් වැඩි වනු ඇති බව සත්‍යයක් වුවද, විශ්ව අධ්‍යාපන මූලධර්ම අනුව යම් සිසුවකුට අනිවාර්ය විශ්ව දෙවන භාෂාවක් උගැන්විය යුත්තේ වයස අවුරුදු 10 සිට බව පෙන්වා දුන්නේය. ප්‍රාථමික පංතිවල ස්වභාෂාවක් එකම අධ්‍යාපන මාධ්‍ය විය යුතු බව හේ අවධාරණය කළේය. විශ්ව විද්‍යාලවලට ඇතුළු වීමට හැකිවන්නේ ඉංග්‍රීසි උගත් අයට පමණක් බවද මෙම වාර්තාවෙන් පෙන්වා දුන්නේය. ඉංග්‍රීසි බස අධ්‍යාපන මාධ්‍යය වෙනුවට, එය අනිවාර්ය දෙවන භාෂාවක් කළ යුතු බවද කීය.

මෙත්තානන්ද මහතා මෙරටේ නූතන බෞද්ධ පුනරුදයේ පතාක යෝධයෙක් බව අවිවාදයෙන් පිළිගැනේ. දහනමවැනි සියවසේ බෞද්ධ පුනරුදයක් ඇති වුවත්, මෙරටේ බෞද්ධ විරෝධී සහ සංස්කෘතික විරෝධී බලවේග සම්පූර්ණයෙන් මුලිනුපුටා දැමිය නොහැකි විය. මේ හේතුවෙන් විසිවැනි සියවසේ මුල භාගයේ අනගාරික ධර්මපාලතුමාට සිංහලයින් අවදි කිරීමටත්, බෞද්ධයින් නගාසිටුවීමටත් ඉමහත් උත්සාහයක් කිරීමට සිදුවී. ලංකාවේ තෙවැනි බෞද්ධ පුනරුද ව්‍යාපාරයේ නිර්මාතෘවූද, මහාබෝධි සමාගම පිහිටුවා බුද්ධාගමේ සහ බෞද්ධ සංස්කෘතියේ නවෝදය සඳහා ක්‍රියාකළා වූද, අනගාරික ධර්මපාලතුමා 1933 අප්‍රේල් මස 29 වන දින අභාවප්‍රාප්ත වීම මෙරටේ බෞද්ධ පුනරුද ව්‍යාපාරයට වැදුණු මරු පහරක් විය. මෙම නොදැරිය හැකි පාඩුවෙන් මෙරටේ බුද්ධාගම සහ සංස්කෘතියේ පුනරුදයකට ජීවිතය කැපකළ මෙත්තානන්ද මහතා එක් අතකින් අනගාරික ධර්මපාලතුමාට මෙන් රිදී සීනු කටහඬක් නොතිබුණත්, බුද්ධාගමට සහ සංස්කෘතියට තමා තුළවූ අකලංක භක්ත්‍යාදරය හේතුකොට ගෙන ගැඹුරු චින්තනයක් සහ කටහඬක් උරුම වීමෙන් මෙත්තානන්දයන්හට නූතන ලංකාවේ බෞද්ධ පුනරුද ව්‍යාපාරය හුදෙකලාව වුවද ගෙනයාමට ශක්තියක් තිබුණි. බුද්ධාගම සහ බෞද්ධ සංස්කෘතිය පිළිබඳ නූතන යුගයේ ඇති විශිෂ්ට සේවාවක් කළ සිල්වත් හා ගුණවත් පැලෑනේ ශ්‍රී

වජිරඥාන මහ නාහිමියන් ක්‍රි. වර්ෂ 1955 සැප්තැම්බර් මස 21 වන දින අපවත්වීම මෙරටට නොදැරිය හැකි පාඩුවක් විය. එහෙත් ඉන් නොසැලුණු මෙත්තානන්ද මහතා මෙරටේ බෞද්ධ හිතෛෂී ප්‍රභූන් සහ සිල්වත් ගුණවත් සංඝපීතෘවරයින් කීප දෙනෙකු හවුල් කරගෙන ධර්මපාලතුමා නැවතූ තැන සිට බෞද්ධ පුනරුද ව්‍යාපාරය ඉදිරියටම ගෙන ගියේය.

මෙත්තානන්ද මහතා ගාල්ලේ පැවති සමස්ත ලංකා බෞද්ධ සම්මේලනයේ සැසි වාරයේදී සභාපති ධූරයට පත් කෙරිණි. මේ අවස්ථාවේදී එතුමා ප්‍රකාශ කළේ තමා කිසිදු ආගමකට විරුදු නොවන බවයි. තමා ධනවාදය, කොමියුනිස්ට්වාදය සහ අධිරාජ්‍යවාදය හෙළා දකින බව එම බෞද්ධ සම්මේලනයේදී ප්‍රකාශ කෙරිණි. ගාල්ලේ සැසිවාරය අමතා අපේ ආගමේ චිරස්ථිතියට හේතුවන ඉතාමත් උත්කෘෂ්ඨ ක්‍රියා සංහතිය නම් බෞද්ධ අධ්‍යාපනය බවත්, අපරාධවලට ප්‍රධාන හේතුව දුප්පත්කම සහ නූගත් කම බවත් ප්‍රකාශ කළේය. අපරාධ වැළැක්වීමට හොඳ ප්‍රතිකාර හාමත්වන ශරීරයටත් හාමත්වන මොලයටත් ආහාර දීමවේ. සදාචාර සම්පන්න ගුණ ගරුක, ජාත්‍යාලය ඇති වැසියන් පිරිසක් මෙරටේ ඇති කිරීම ඔහුගේ පරම අධ්‍යාශය විය. සමහරු එතුමා ආගම් පිස්සා යන විරුද නාමයෙන් හැඳින්වුවත්, කිසි

දිනක අන්‍ය ආගම්වලට නොගැරහීය. බෞද්ධ පුනරුද ව්‍යාපාරයක් ඇති කිරීමෙන් ඔහු අපේක්ෂා කළේ බුද්ධාගමට සහ බෞද්ධයින්ට නැතිවී ගිය අයිතිවාසිකම් නැවත ලබා ගැනීමය. 1815 උඩරට ගිවිසුමේ පස්වැනි ...ගන්තියෙන් බ්‍රිතාන්‍ය රජය බුද්ධාගම ...නාකඩවා ආරක්ෂා කිරීමට වූ පොරොන්දුව ...ළි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළු කළ ...තුයයි මොරගා කීය. ක්‍රි. වර්ෂ 1818 ...නොවැම්බර් මස 21 වැනි දින කරන ලද ...ප්‍රකාශනයට අනුව, අන්‍ය ආගමික නිකායවලට ...බාදී ඇති ඉඩකඩම් පිළිබඳව නීතිය ...නීත්‍යානුකූලව ක්‍රියා කිරීමට ඉල්ලීය. ඒ අතර ...කතෝලික පල්ලිය සතු ඉඩම් ප්‍රමාණය සහ ...ම ඉඩම් බෞද්ධ විහාරගම් පාලනය කරන ...යුරින් කළයුතු බව පෙන්වා දුනි. 1947 ...ආණ්ඩු ක්‍රමයේ 29 (2) වගන්තිය අවලංගු ...කිරීමත්, පොහොය සතර ප්‍රසිද්ධ නිවාඩු දින ...කිරීමත් ඉල්ලා සිටින ලදී. ත්‍රිපිටකය සිංහල ...භාෂාවෙන් මුද්‍රණය කිරීමට ද රජයෙන් ඉල්ලී.

බෞද්ධ සම්මේලනය විසින් 1950 ගණන් ...ල අතහැර දැමූ ආගමික සටන නැවත දියත් ...කිරීමට මෙත්තානන්ද බෞද්ධ ජාතික ...බලවේගය නැමැති ව්‍යාපාරයක් පිහිටුවා ...ගත්තේය. මෙම ව්‍යාපාරයට තරුණයින් ...දවාගෙන ඉංග්‍රීසි නොදන්නා, දුප්පත්, ...සරණ අහිංසක ජනතාවගේ ප්‍රශ්න ...විරාකරණය කරදීම සඳහා යකා සමග හෝ ...ක්වීමට හේ තීරණය කළේය. එකල රටේ ...ගොඩනැගෙමින් තිබුණ සංස්කෘතිය තුප්පහි ...සංස්කෘතියක් ලෙසත්, සමහර බෞද්ධයන් ...තම්පරාදු" බෞද්ධයන් ලෙසත් හංවඩු ...ැසිනි. හෙතෙම අමද්‍යප සටනද දියත් ...ළේය.

1953 දෙසැම්බර් මස 27 වන දින ...ගල්ලේ පැවති සමස්ත ලංකා බෞද්ධ ...සම්මේලනයේ සැසි වාරයේදී බෞද්ධ ...තොරතුරු පරීක්ෂක සභාවක් පත්කර ගැනීමට ...මත්වී. මෙම පරීක්ෂණ සභාවට බෞද්ධ ...අධ්‍යාපනය, බෞද්ධවිහාර දේවාල ඉඩම්, ...සිංහල භාෂාව යන විෂයයන් අධ්‍යයනය ...කිරීමට පැවරිණි. මෙම කොමිෂන් සභා ...වාර්තාවේ බෞද්ධ අධ්‍යාපනය නමැති ...පරිච්ඡේදය ලියන ලද්දේ මෙත්තානන්ද මහතා ...යිනි. මෙම පරීක්ෂණ සභාවේ පූජ්‍ය ...අත්වැල්ලේ සිද්ධාර්ථ, හාලියාලේ ...සුමනතිස්ස, පලොන්නොරුවේ විමලධම්ම, ...නන්ද මෛත්‍රිය, ශ්‍රී ඥානාලෝක, කොටහේනේ ...ප්‍රඥාකීර්ති, මඩිහේ පඤ්ඤාසීහ, යන ...ස්වාමීන් වහන්සේලාත්, ජී. පී. මලලසේකර, පී. ...ඇස් කුලරත්න, එල්. එච්. මෙත්තානන්ද, ඩී. ...විජයවර්ධන, තෙන්නකෝන් විමලානන්ද, ...ඩී. එස්. සිරිවර්ධන, ටී. බී. ගොඩමුන, එම්. ...යූ. ද සිල්වා, එම්. ඩී. සී. අබේරත්න යන ...මහත්වරුන් ක්‍රියා කළහ. 1956 පෙබරවාරි මස ... වැනි දින තමා විදුහල්පති තනතුරු දැරූ ...ආනන්ද විදුහලේදී බෞද්ධ තොරතුරු ...පරීක්ෂක සභාවේ වාර්තාව පිළිගැන්විණි. ...පමණක් නොව මෙම වාර්තාවේ යෝජනා ...රජයට පිළිගන්වා ඒවා ක්‍රියාගත කිරීමට බල ...කෙරිණි.

බෞද්ධ ජාතික බලවේගය තුළින් මෙරටේ ...බෞද්ධයින්ගේ අයිතිවාසිකම් මොනවාද? එම ...අයිතිවාසිකම් නැතිවී ගොස් ඇති ආකාරයද ...ලේඛන ආශ්‍රයෙන් පෙන්වා දුණි. ...එකට මෙරටේ තිබුණු පුවත්පත් කීපයක් ...බුද්ධාගමට සහ බෞද්ධයිනට පහරපිට පහර ...දී මෙත්තානන්ද පුවත්පත් කොමිෂමක් ...ඉල්ලා උද්ඝෝෂණය කෙරිනි. මෙසේ පත්කළ ...පුවත්පත් කොමිසම ඉදිරියේ සාක්ෂිදුන් ...මෙත්තානන්ද, පුවත්පත් නිදහස තිබිය යුතු ...බවත්; වගකීමෙන් කටයුතු කිරීම ජාතික පුවත්පතක කාර්යයක් විය යුතු බවත් පෙන්වී. නිදහස් පුවත්පත් මණ්ඩලයක් පිහිටුවීමට යෝජනා කළේ එහෙයිනි. අසැබි පතපොත තහනම් කිරීමටත් සුරාසුදුව නැවතීමටත් බෞද්ධ ජාතික බලවේගය ඇප කැපවී, මෙරටේ තුප්පහියන් යනු පියාගේ බීර බෝතලේ පුතා බොන, සිගරට්ටුව උරන, බිරිඳ අන්සැමියෙකු පතන, පිය දුවණි ආලිංගන නැටුමේ යෙදෙන අය ලෙස පෙන්වා දුන්නේය.

1943 මැලේරියා මර්දන ව්‍යාපාරයටත්, 1935 සූරියමල් ව්‍යාපාරයටත් ඉතා සම්බන්ධව ක්‍රියාකළ මෙත්තානන්ද මහතා 1946 වන තුරු දේශපාලනය ගැන උනන්දුවක් නොවී හෙතෙම ආනන්දය විශිෂ්ට තත්ත්වයකට පත් කිරීම පරම අභිලාෂය කර ගත්තේය. 1948 දී නිදහස ලත් තම රට කිනම් ආකාරයෙන් දියුණු වේදැයි බලා සිට ආගමික හා සංස්කෘතික අංශ කෙරෙහි දියුණුවක් ඇති කිරීමේ අභිලාෂයෙන් දේශපාලනයේ නියැලීමට තීරණය කළේය. බෞද්ධ තොරතුරු පරීක්ෂක සභාවේ වාර්තාව ක්‍රියාගත කිරීම ප්‍රමාද වූ විට මෙත්තානන්ද මහතා තීරණය කළේ තමාම දේශපාලන පක්ෂයක් පිහිටුවා මෙම අරමුණු ඉටුකරගත යුතු බවය.මේ සඳහා 1959 දී ධර්ම සමාජ පක්ෂය පිහිටුවා ගත්තේය. 1956 වර්ෂයේ මෙරටේ හට ගත් ආගමික, සංස්කෘතික හා දේශපාලන වෙනස්කම් පිළිබඳව ඉතා විමසුම් දැසින් බැලූ මෙත්තානන්ද මහතා සෑහීමකට පත් නොවීම නිසා ධර්ම සමාජ පක්ෂය බිහි කළේය. මෙම පක්ෂයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ගැබ්වී තිබුණේ තම ජීවිත කාලය තුළදී එතෙක් විශ්වාස කළ දෙස, බස රැස රැක ගැනීමේ වැඩ පිළිවෙලකි. එතුමා දේශපාලනයේදී වාමාංශිකයෙකු හෝ දක්ෂිණාංශිකයෙකු හෝ නොවීය. එතුමාගේ එකම සටන සිංහල බෞද්ධ ප්‍රබෝධයක් ඇතිකර මහජාතියට මෙතෙක් නොලැබූ අයිතිවාසිකම් සහ වරප්‍රසාද ලබා ගැනීමත් ජාත්‍යාලය ඇති පුරවැසියන් පිරිසක් බිහිකර රට සංවර්ධනය සඳහා නිවහල් අදහස් ඇති, අවංක එඩිතර පුරවැසියන් බිහි කිරීමත් ඔහුගේ දේශපාලන පක්ෂයේ අරමුණ වී.

කිසි දිනක එවකට පැවති නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට පත්වීම නොපැතුවේය. නොසිතුවේය. ඔහුගේ පරම අභිලාෂය වූයේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට යාමට අදහස් කරන අය ලවා තම අදහස් ක්‍රියාගත කරවීමය. මෙත්තානන්ද මහතා පාලකයින් තනන්නෙක් මිස, පාලකයකු නොවීය. 1956 දී එතුමා ඉදිරිපත් කළ සිංහල භාෂාව රාජ්‍ය භාෂාව කිරීම, සියළුම පාසල් රජයට ගෙන ජාතික අධ්‍යාපනයක් සකස් කිරීම, පොහෝ දින රජයේ ප්‍රසිද්ධ නිවාඩුවක් කිරීම, අධ්‍යාපනයේ සහ රාජ්‍ය සේවයේ සාධාරණත්වය සහ සමානත්වය තුළින් බහුතර ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම වැනි අදහස් පසුකල රට පාලනය කළ නායකයින් ක්‍රියාවට නැංවීම මෙත්තානන්ද මහතාගේ දේශපාලන අපේක්ෂාවන් බොහෝ දුරට මුදුන්පත්වීමක් ලෙස සැලකිය හැකිය. 1959 තමා පිහිටුවාගත් ධර්ම සමාජ පක්ෂය එවකට රටේ පැවති මහජන එක්සත් පෙරමුණ හා 1960 අප්‍රේල් මස 24 වෙනි දින ඒකාබද්ධ කරනු ලැබුවේ තමා උතුම්කොට සැලකූ අදහස් හා ප්‍රතිපත්ති ක්‍රියාගත කරවීමටය. තම අදහස් තමා සිතූ පරිදි ඉටු නොවූ විට මෙත්තානන්ද මහතා දේශපාලන කටයුතුවල යෙදීම අතහැර දමා බෞද්ධ පුනරුද සටන තනිවම ගෙන ගියේය.

1956 මාර්තු මස තුන්වැනි දින මෙත්තානන්දයෝ බෞද්ධ පෙරමුණ නම් පුවත්පතක් ඇරඹී. මෙම පුවත්පතේ අරමුණ මෙසේ මුල් පිටුවේ සඳහන් විය. අවුරුදු 2500 ටත් පැරණි ඉතිහාසයක් ඇති සිංහල බෞද්ධයින් වූ අපි කිසිකලෙක අන් කිසි ජාතියකට හෝ ආගමකට හෝ හානි නොකෙළෙමු. මතුවට ද හානි නොකරන්නෙමු එහෙත් යම්සේ අපේ මුතුන් මිත්තෝ සිය ජාතිය හා ආගම් රැක ගැනීම සඳහා ජීවිත පූජාවෙන් සටන් කළෝද, එසේම දැනුදු අපි අපේ නැතිවූ අයිතිවාසිකම් ලබා ගැනීම සඳහා එක්සත්ව සටන් කරමු.

1955 වර්ෂයේදී ආනන්ද විදුහලින් සමුගත් මෙත්තානන්ද මැතිතුමා ජාතික මෙහෙවර සඳහා ආනන්ද විදුහල තම මධ්‍යස්ථානය කර ගත්තේය. 1956 මාර්තු මස 03 වැනි දින ආනන්ද විදුහලේ රැස්වීමක් පවත්වා එවකට දේශපාලන පොරපිටියට බැස තිබූ එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතාට දස පනතක් ඉදිරිපත් කළේය. මෙම දස පනත මෙත්තානන්දයන් තුළ පැවති අහිංසකත්වය, සිංහල භාෂාව, බුද්ධාගම සහ බුද්ධශාසනයට තිබූ ලැදියාව, ප්‍රජාතන්ත්‍රීය භාවය පිළිඹිබු කරයි. දස පනත, අහිංසාව, අධර්මයට විරුදුවීම, බෞද්ධ කොමිෂන් සභා වාර්තාව ක්‍රියාගත කිරීම, රාජ්‍ය භාෂාව සිංහලය කිරීම, බුද්ධාගමට හිමිතැන දීම, ප්‍රජාතන්ත්‍රවාදය අගය කිරීම සහ ඒකාධිපතිවාදයට විරුදුව දක්වා තිබිණි. එකල සිවිල් සේවයේ කැපී පෙනුනු නිශ්ශංක විජයරත්න, රොනී ද මැල්, ඇන්. කඳසූක වැනි අයද, තමා ධර්මරාජ විදුහලේ විදුහල්පති ලෙස සේවය කරන අවධියේ කුළුපගවූ රජයේ ලිපිකාර සේවයේ සිටි ගුණසීල විතානගේ වැනි බුද්ධාගමට සහ සිංහල භාෂාවට ඇල්මක් දැක්වූ අය තමා වටා රොක්කර ගනිමින්ද, මහා සංඝයා වහන්සේ, විශේෂයෙන් පූජ්‍ය මාපිටිගම බුද්ධරක්ඛිත, තල්පාවිල සීලවංශ, හැවැන්පොළ රතනසාර, බඹරැන්දේ සිරි සීවලී යන නා හිමිවරුන්ගේ සහාය ඇතිව බෞද්ධ ජාතික බලවේගය රටපුරා රැගෙන ගියේය. බෞද්ධ ජාතික බලවේගයේ කටයුතු රාජ්‍ය සේවාවේ පමණක් නොව රාජ්‍ය නොවන සංවිධානවලටද බලපෑමක් ඇති කිරීමට සමත් විය. මෙම ව්‍යාපාරයේ මූලික අරමුණ වූයේ අන්‍යාගම්වලට පහර ගැසීම නොව, බෞද්ධයාගේ නැතිවී ගිය අයිතිවාසිකම් යළි දිනා ගැනීමය. රටේ බහුතර ජනතාවට සිදුවී ඇති අසාධාරණය පෙන්වා දුන් මෙත්තානන්ද මහතා එවකට බලයට පත්වීමට සිටි සහ බලයට පත්වූ රජයනට අහිංසාවාදීව බෞද්ධ ජාතික බලවේගය මගින් ප්‍රකාශිත Catholic Action in Ceylon නැමැති කුඩා ග්‍රන්ථය බෞද්ධ ජාතික බලවේගයේ කටයුතු පුළුල්වීම නිසා එවකට රාජ්‍ය පාලනය කළ අයට මෙත්තානන්ද මහතා හිසරදයක් විය. ඕනෑම කෙරුම්කාරයෙකුට නොබියව එතුමා ඇත්ත පෙන්වා දුන්නේය. ඇත්ත කීවේය. වරද දුටුතැන එය තදින් විවේචනය කළේය. මෙය එතුමා කළේ වෛරයකට නොව රටටත්, ජාතියටත් බෞද්ධාගමටත් එතුමා තුළ තිබුණු අවංක ආදරය නිසාය.

ලංකාවේ දේශපාලන, ආගමික, සාමාජික ජීවිතය අමුතු මගකට හැරවීමට ලොකු බලපෑමක් ඇති කළ සිංහල බෞද්ධ ජනනායකයෙකු වශයෙනුත්, දේශප්‍රේමියෙකු වශයෙනුත්, අධ්‍යාපනඥයෙකු වශයෙනුත්, ලංකා ඉතිහාසයේ වැදගත් තැනක් මෙතුමාට හිමිවේ. මෙත්තානන්ද මහතා විසින් ආනන්ද විදුහලේ විදුහල්පතිව සිටි කාලය තුළදී අධ්‍යාපනය ලද සිසුන් අනාගතයේදී රටට අවංක සේවයක් කළ අයුරු දැක එතුමා සතුටු වන්නට ඇත. මෙත්තානන්ද මහතා තුළ සය වැදෑරුම් ගුණයන් පිහිටා තිබුණි.

1. පෞද්ගලික ලාභාපේක්ෂාවෙන් තොර බව.
2. අනවශ්‍ය ලෙස ධනය රැස් නොකිරීම.
3. වගකීමෙන් තොර ප්‍රකාශ නොකිරීම.
4. ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම.
5. චාම් බව.

මෙවැනි උතුම් ගුණ පිහිටි එතුමන්ගෙන් අපට ගතහැකි ආදර්ශ බොහෝය. නූතන ලංකා ඉතිහාසයේ බෞද්ධ පුනරුද ව්‍යාපාරයේ පතාක යෝධයා වූ මෙත්තානන්ද මහතාගේ නාමය කෘතවේදී බෞද්ධ හා ලාංකීය ජනතාව සදනුස්මරණය කරනු ඇත. ඔහු ගොඩනැගූ ආනන්ද මහා විද්‍යාලය එතුමා මුළු ජීවිත කාලය තුළ ගෙනගිය ප්‍රතිපත්ති වල ප්‍රතිමූර්තියක් වේවා!

ආචාර්ය කේ. ඩී. ජී. විමලරත්න